ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය

නීති අධ්‍යයන දෙපාර්තමේන්තුව

නීතිවේදී උපාධි පාඨමාලාව - 3 වන මට්ටම

අවසාන පරීක්ෂණය - 2017/2018

LLU3901/LWU1201- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය I

කාලය - පැය තුනයි. (03)

---

දිනය - 2020.02.20 වේලාව - පෙ.ව.09.30 - ප.ව.12.30

---

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

අපැහැදිලි අත්අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.

01. "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදකයින් හට , ජනරජයක් සපයන අතරම, ස්වස්ථානික නැතහොත් තම භූමියෙන්ම සැකසුන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ද අවශ්‍යය විය. ඔවුන්ගේ පරමාර්ථය වූයේ නෛතික විප්ලවයක් හෝ පූර්ව ක්‍රියාවලිය (පෙර පැවති ක්‍රමය) සමඟ වූ නෛතික අඛණ්ඩතාවයේ බිඳීමක් ක්‍රියාත්මක කිරීමයි."

J.A.L. Cooray, *CONSTITUTIONAL AND ADMINISTRATIVE LAW OF SRI LANKA* (CEYLON),(1973) P.72

ඉහත තත්ත්වය 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සැකසීම නිවැරදිව පිළිබිඹු කරන්නේ ද? අදාල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය සංකල්පයන් සහ විනිශ්චිත නඩු තීරණ ඇසුරෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 20)

02. හස්කි රාජ්‍යයේ ජනතාව විසින් මෑතකදී පැවති ජනාධිපතිවරණයේ දී බහුතර ඡන්දයෙන් ජනාධිපතිවරයෙකු තෝරාපත් කර ගනු ලැබීය. ජනාධිපතිවරයා, පළමු කැබිනට් මණ්ඩල රැස්වීමෙන් පසුව , පෙර පැවති රජයේ ජනාධිපතිවරයා විසින් පොදු අරමුණක් සඳහා පවරා ගනු ලැබූ අක්කර 15 ක භූමි ප්‍රමාණයක් පුද්ගලික ආයතනයකට විකිණිය යුතු බවට නියෝගයක් අනුමත කර අත්සන් කරනු ලැබීය. නව ජනාධිපතිවරයාට එරෙහිව පහත නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට, එරට පාර්ලිමේන්තුවේ විපක්ෂ නායකවරයා තීරණය කොට ඇත:

a) ජනාධිපතිවරයාට එරෙහිව එරට ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියේ නඩු පැවරීමට;

b) ජනාධිපතිවරයාට එරෙහිව දෝෂාභියෝගයක් ගෙන ඒමට;

ඉහත ක්‍රියාමාර්ගවල වලංගුභාවය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය ප්‍රතිපාදන ඇසුරෙන් සාකච්ඡා කරන්න. හස්කි රාජ්‍යයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ශ්‍රී ලංකාවේ වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හා සමාන බව උපකල්පනය කරන්න. (ලකුණු 20)

03. "රජයේ එක් ශාඛාවක් අනෙක් ඒවා කෙරෙහි ආධිපත්‍යය දැරීමට ඉඩ නොතැබිය යුතු බව අනිවාර්යයෙන්ම අනුගමනය නොකෙරේ. සෑම ශාඛාවක් ම අනෙක් ඒවා පරීක්ෂා කිරීමක් ලෙස ක්‍රියාත්මක වන පරිදි කරුණු සැලසුම් කර ඇත."

De Smith, *CONSTITUTIONAL LAW AND ADMINISTRATIVE LAW* (1977),p.32

ඉහත ප්‍රකාශය ඇසුරෙන් බලතල බෙදීමේ සිද්ධාන්තයේ අදාල බව සාකච්ඡා කරන්න. ඔබේ පිළිතුර ශ්‍රී ලංකාව, එක්සත් රාජධානිය හා ඇමෙරිකා එක්සත් ජනපදය ඇසුරෙන් ලබා ගත් උදාහරණ මඟින් තහවුරු කරන්න. (ලකුණු 20)

04. "පුළුල් දේශපාලනික සංකල්පයක් වශයෙන් නීතියේ ආධිපත්‍යය පිළිබඳව සරල හා පැහැදිලි ප්‍රකාශයක් සැකසීමේ හැකියාවක් නැත. සමාජය වර්ධනය වන විට සහ රජයේ කර්තව්‍යයන් වෙනස් වන විට නීතිඥවරුන්, දේශපාලනඥයින් සහ පරිපාලකයින් වෙනස් වන්නා වූ අවශ්‍යතාවයන්වලට මුහුණ දීමට, පවත්නා වූ නීතියේ වටිනාකම් වලට අනුගත විය යුතුය."

A.W.Bradley & K.D.Ewing, *Constitutional and Administrative Law* (1997) 12th Edn p.111

නීතියේ ආධිපත්‍යය සඳහා වන ඩෙනිස් ලොයිඩ්ගේ අර්ථ නිරූපණය කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා පාලන සංදර්භය තුළ නීතියේ ආධිපත්‍යය යන සංකල්පය ඇසුරින් ඉහත ප්‍රකාශයේ වලංගු භාවය අගයන්න.

ඔබේ පිළිතුර සුදුසු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය ප්‍රතිපාදන හා නඩු තීරණ මඟින් තහවුරු කළ යුතුය. (ලකුණු 20)

05. "... 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මෙන් නොව පාර්ලිමේන්තුවේ ව්‍යවස්ථාදායක ආධිපත්‍යය යන සංකල්පය 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ප්‍රධාන ලක්ෂණය බවට පත්වීම අවසන් වී ඇත."

R.K.W.Goonesekara and Jayantha de Almeida Guneratne, *Constitutionl Law Block 1* (1984) *The Open University of Sri Lanka,* p.111

ශ්‍රී ලංකාවේ පළමු සහ දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවන්ගෙන් ලබා ගත් උදාහරණ ඇසුරෙන් ඉහත ප්‍රකාශය විවේචනාත්මකව අගයන්න. (ලකුණු 20)

06. නිදහසින් පසු ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ත්‍රිත්වය යටතේ සුළු ජාතීන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කර දී ඇති ආකාරය සහ ඒ සඳහා වන උපාය මාර්ගයන් ඇගයීමට ලක් කරන්න. ඔබේ පිළිතුර අදාල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය ප්‍රතිපාදන හා නඩු තීරණ මඟින් පහදන්න. (ලකුණු 20)

07. පහත ඒවායින් ඕනෑම <u>දෙකක් (02)</u> සාකච්ඡා කරන්න.

(a). ඔම්බුඩ්ස්මන් වරයාගේ බලතල හා එම ධුරයේ කාර්යයන්වල සඵලත්වය

(b). ශ්‍රී ලංකාවේ තොරතුරු දැන ගැනීමේ අයිතිය පිළිගැනීම සහ එහි විෂය පථය

(c). ශ්‍රී ලංකාවේ මහජන සුභසාධක නඩුකර

(ලකුණු 02 x 10 = 20)

08. ඩිස්නි රාජ්‍යයේ කීර්තිමත් ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරයකු වූ පාලිත සමරසිංහ මහතාව එරට විධායක ජනාධිපතිවරිය විසින් එම ධූරයෙන් ඉවත් කරන ලදී. විනිසුරුවරයා ඔහුගේ පාසල් සගයෙකු වූ සඳරුවන් ජයවර්ධන සමඟ කල දුරකථන සංවාදයක් අනිසි ලෙස මාධ්‍යවල ප්‍රචාරය වීම නිසාවෙන් එලෙස සිදු කරන ලදී. එම කාලවකවානුව තුලම අභියාචනාධිකරණ විනිශ්චයකාරවරියක වන නදීශා රත්නායක මහත්මිය එකී හිස්වන ධූරය සඳහා පත් කිරීමට තීරණය කොට ඇත.

ඉහත සිදුවීම පාදක කොටගෙන අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

a). ඩිස්නි රාජ්‍යයේ ජනාධිපතිවරියට ඇයගේ අභිමතය පරිදි පාලිත සමරසිංහ නම් වූ ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරයාව ඉවත් කල හැකි ද?

b) පාලිත සමරසිංහ නම් වූ විනිශ්චයකාරවරයා ඉවත් කිරීමෙන් හිස්වන විනිශ්චයකාර ධූරය සඳහා ජනාධිපතිවරියට, සිය කැමැත්ත පරිදි අභියාචනාධිකරණ විනිශ්චයකාරවරයෙකු පත් කල හැකි ද?

ඩිස්නි රාජ්‍යයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සමාන බව උපකල්පනය කරමින් හා අධිකරණයේ ස්වාධීනත්වය පිළිබඳව අවධානය යොමු කරමින් මෙම සිද්ධියේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය අනුමිතීන් පිළිබඳ අදහස් දක්වන්න.

(ලකුණු 20)

හිමිකම් ඇවිරිණි.